රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ
අංක: 152

මගේ අංකය: ඒස්/ බී 05/2
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ
අමාත්‍යාංශය, (ආයතන අංශය)
නිදහස් චතුරශ්‍රය,
කොළඹ - 7.

1979 නොවැම්බර් මස 9 වැනි දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

## රජයේ දෙපාර්තමේන්තු කොළඹ නගරයෙන් බැහැර කිරීම

වාණිජ කටයුතු කෙරෙහි සමීප සම්බන්ධතාවයක් ඇති දෙපාර්තමේන්තු හැර අනෙකුත් රජයේ දෙපාර්තමේන්තු කොළඹ නගරයෙන් බැහැර කිරීමට රජය තීරණය කර ඇත.

02. එමනිසා, රජයේ දෙපාර්තමේන්තු නාගරික සීමාවෙන් පිටතට ගෙන යෑම සඳහා නාගරික සංවර්ධන අධිකාරියේද සහාය ඇතිව වැඩපිළිවෙලක් පිළියෙල කිරීම අවශ්‍යව ඇත.

03. නගර සීමාවෙන් පිටතට දෙපාර්තමේන්තු බැහැර කිරීම සම්බන්ධයෙන්, නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉල්ලා සිටින කිසියම් තොරතුරක් වෙතොත්, කරුණාකර කල්වේලා ඇතිව සපයන්න. එම තොරතුරු නියමකර ඇති කාලසීමාවෙන් තුලදී සැපයීම අතපසු කළහොත්, ඔබගේ ඉල්ලීම් සලකා බැලීමට නොහැකිවීමට ඉඩ ඇති බවද සලකන්න.

අ.ක./ ඩී.බී.අයි.පී.එස්. සිරිවර්ධන
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු
පිළිබඳ අමාත්‍යාංශය.

ආයතන අධ්‍යක්ෂ.

පු/-07